

(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 195.]

පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

2026 නොවැම්බර් 05 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

34/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහපොළ භාරකාර අරමුදල පිහිටුවීමේ අරමුණු;

(ii) එම අරමුදල සඳහා මුදල් ලැබෙන මූලාශ්‍ර;

(iii) අරමුදලේ වත්කම් උපයෝගී කරගනිමින් රජය විසින් දේපළ මිලදී ගෙන තිබේ නම්, ඒ පිළිබඳ විස්තර;

(iv) එම දේපළ හෝ ආයෝජන මඟින් අරමුදලේ මූල්‍යමය ශක්තිය සහ ආදායම් තත්ත්වය වර්ධනයවී තිබේ නම්, ඒ පිළිබඳ විස්තර;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

164/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් අර්ජුන මහේන්ද්‍රන් යන අයට චෝදනා එල්ලවූ වර්ෂය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් ඔහුට එරෙහිව මෙරට අධිකරණ මඟින් නිකුත් කර ඇති නොතීසි සංඛ්‍යාව කොපමණද;

(iii) එම නොතීසි නිකුත් කළ දින සහ ඒවා නිකුත් කරන ලද අධිකරණවල නම් කවරේද;

(iv) මෙතෙක් ඔහු මෙරටට ගෙන්වා ගැනීමට නොහැකි වීමට බලපා ඇති හේතු කවරේද;

(v) ඔහු මෙරටට ගෙන්වා ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

688/2025

ගරු රෝහණ බංඩාර මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අස්වැසුම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා 2024 වර්ෂයේ සිට මේ දක්වා ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට එම අයදුම්පත් අතරින් ක්‍රියාමාර්ග ගෙන ඇති අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මේ වනවිට එක්රැස්වී ඇති අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iv) එම අයදුම්පත් නිසි පරිදි ඇගයීමට ලක් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

989/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ ශ්‍රමිකයන් සඳහා විදුලි වාහන ආනයනය කිරීමේ විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කළ බව දන්නේද;

(ii) ඒ යටතේ මෙරටට ආනයනය කර ඇති විදුලි වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) වැඩසටහන සඳහා අනුගමනය කළ සුදුසුකම් ලැබීමේ නිර්ණායක කවරේද;

(iv) එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අක්‍රමිකතා හෝ දූෂණ සිදුවී ඇති බවට ලැබී ඇති පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා තිබේද;

(v) එසේ නම්, ඒ සඳහා වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2045/2026

ගරු ඥානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සමස්ත විදුලි ජනනයෙන් එක් එක් විදුලි ජනන ක්‍රමයේ දායකත්වය ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වැඩි පිරිවැයක් සහ අවම පිරිවැයක් සහිත විදුලි ජනන ක්‍රම කවරේද;

(iii) වැඩි පිරිවැයක් සහිත විදුලි ජනන ක්‍රම කෙරෙහි ඇති නැඹුරුතාවය අවම කිරීම සඳහා සැලසුම් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2025 වර්ෂයේ සිට මේ දක්වා සිදු කරන ලද විදුලි ගාස්තු සංශෝධනය කළ වාර සංඛ්‍යාව කොපමණද;

(ii) විදුලි ගාස්තු සංශෝධන හේතුවෙන් ගෘහස්ථ පාරිභෝගිකයන්ට දැරීමට සිදුවූ අමතර ගාස්තුව සාමාන්‍යයක් ලෙස කොපමණද;

(iii) අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහන වැඩසටහන් ක්‍රියාත්මක කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2327/2026

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් රථ අතරින් සුඛෝපභෝගී, අර්ධ සුඛෝපභෝගී සහ සාමාන්‍ය බස් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2026 වර්ෂයේදී මෙරටට ආනයනය කරන ලද මෙට්‍රෝ බස් රථ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ධාවනය වන පෞද්ගලික බස් රථ සංඛ්‍යාව පළාත් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් බලපත්‍ර නිකුත් කර ඇති පෞද්ගලික බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iii) බලපත්‍ර නිකුත් කිරීම සහ අනෙකුත් අදාළ සේවාවන් මඟින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වාර්ෂිකව ලබන ආදායම දළ වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2354/2026

ගරු මයිල්වාගනම් පෙගදීස්වරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) වවුනියාව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ආරම්භ කළ දින සිට මේ දක්වා වාර්ෂිකව සංවර්ධන හා නඩත්තු කටයුතු සඳහා වෙන් කළ ප්‍රතිපාදන, වැය කළ මුදල සහ සිදු කළ කාර්යයන්, භාවිතයට නොගත් ප්‍රතිපාදන ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අබලන් තත්ත්වයට පත්වී ඇති සිසු නේවාසිකාගාර, විද්‍යාපීඨ ගොඩනැගිලි සහ පරිහානියට පත්වී ඇති ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iii) නොඑසේ නම්, ප්‍රතිපාදන වෙන් කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල හිඟය නිරාකරණය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(ii) අමාත්‍යාංශයේ නිලධාරීන් මෑතකදී විද්‍යාපීඨය නිරීක්ෂණය කර තිබේද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී නිරීක්ෂණයක් සිදු කරන්නේද;

(iv) ඉහත සඳහන් ගැටලු නිරාකරණය කිරීම සඳහා කඩිනම් පියවර ගනු ලබන්නේද;

යන්න එතුමිය තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2403/2026

ගරු තිළිණ සමරකෝන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හබරණ, මින්නේරිය සහ කවුඩුල්ල ප්‍රදේශ ආශ්‍රිතව ක්‍රියාත්මක වන උද්‍යාන සහ ඒවා පාලනය කරනු ලබන ආයතන කවරේද;

(ii) 2026 වර්ෂයේ මේ දක්වා එම උද්‍යාන නැරඹූ දේශීය සහ විදේශීය සංචාරකයන් සංඛ්‍යාව සහ ලැබූ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මින්නේරිය ජාතික වනෝද්‍යානයට පැමිණෙන දේශීය සහ විදේශීය සංචාරකයින් සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කරන ක්‍රමවේදය කවරේද;

(ii) එම ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ සහ සංචාරකයන් උද්‍යානයට ඇතුළත් කිරීමේ ක්‍රමවේදයේ දුර්වලතා පවතින බව පිළිගන්නේද;

(iii) එම වනෝද්‍යානය තුළ ඇති සත්ව කෞතුකාගාරය මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(v) දෛනිකව පැමිණෙන සංචාරකයන් සඳහා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් තිබේද;

(vi) එසේ නම්, පවතින වැසිකිළි හා කැසිකිළි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2471/2026

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මත්ද්‍රව්‍ය චෝදනා සම්බන්ධයෙන් රක්ෂිත බන්ධනාගාරගත කර සිටින සැකකරුවන්, දඬුවම් ලබන රැඳවියන් සහ මරණ දණ්ඩනය නියමවූ රැඳවියන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රැඳවියන්ගේ ආහාරපාන සහ අනෙකුත් පහසුකම් සඳහා දිනකට වැය කරන මුදල කොපමණද;

(iii) සුළු වැරදි සඳහා රක්ෂිත බන්ධනාගාරගත කර සිටින පුද්ගලයන් සඳහා ඇප කොන්දේසි ලිහිල් කිරීම හෝ විකල්ප දඬුවම් ක්‍රම හඳුන්වා දීමට සැලසුම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ දැනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) බන්ධනාගාර නිලධාරීන්ගේ ආරක්ෂාව, සේවා පහසුකම් සහ වෘත්තීය ගැටලු විසඳීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) රැඳවියන්ගේ සෞඛ්‍ය, සනීපාරක්ෂාව සහ පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීමට වර්තමාන රජය ගෙන ඇති පියවර කවරේද;

(iv) රැඳවියන් පුනරුත්ථාපනය කිරීම සහ සමාජගත කිරීම සඳහා ක්‍රියාත්මක වන වැඩසටහන්වල ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2506/2026

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ අස්වනු කළමනාකරණය සඳහා නිසි ආර්ථික මධ්‍යස්ථානයක් නොමැති වීම හේතුවෙන් ගොවීන් සහ ධීවරයන්ට සිදුවන ආර්ථික පාඩුව පිළිබඳ අමාත්‍යාංශය සතුව දත්ත වාර්තා පවතින්නේද;

(ii) බහුල වශයෙන් අස්වනු ලැබෙන කාලවලදී මෙම ප්‍රදේශවල ගබඩා පහසුකම් නොමැතිකම හේතුවෙන් ආහාර නාස්තිය සිදුවන බවත්, එය ජාතික ආහාර සුරක්ෂිතතාවයට සෘජුවම බලපාන බවත් පිළිගන්නේද;

(iii) පුත්තලම දිස්ත්‍රික්කය කේන්ද්‍රකර ගනිමින් නවීන පහසුකම් සහිත ආර්ථික මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා රජය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එවැනි ආර්ථික මධ්‍යස්ථානයක් මඟින් අස්වනු නාස්තිය අවම කිරීමට සහ අතිරික්ත අස්වනු අගය එකතු කළ නිෂ්පාදන බවට පත් කිරීමට ඇති සැලසුම් කවරේද;

(ii) එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය සහ ඒ සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී
යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 2 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේ දී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

2.

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

"ද ගුඩ්නස් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි"

යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

භාර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— පරිපූරක මුදල,— ශීර්ෂය 224 — වැඩසටහන 01 — †2026 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන භාරදහස් දෙසිය හැට එකක් (රු. 4,261,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

උපලේඛනය

ශීර්ෂය	**224**	-	ශ්‍රී ලංකා ගුවන් හමුදාව
වැඩසටහන	**01**	-	මෙහෙයුම් වැඩසටහන
			මූලධන වියදම් — රු. 4,261,000,000
			මුළු වියදම — **රු. 4,261,000,000**

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

†2026 නොවැම්බර් 03 දින ඉදිරිපත් කරන ලද 2026 අංක 8 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 7 දක්වා එකතුව රු. 669,413,000,000

*3.

ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය. (2026 ඔක්තෝබර් 23) [1].

*4.

ශ්‍රී ලංකා ක්‍රිකට් පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

ආගමන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

විදේශීය ත්‍රස්තවාදී සටන්කරුවන් වැළැක්වීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2022),— 1987 අංක 50 දරන උපරිමාධිකරණ සංකීර්ණය කළමනාකරණ මණ්ඩල පනතේ 11(2) වගන්තිය යටතේ 2023.11.22 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*12.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව (2022),— 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 93(2) වගන්තිය යටතේ 2024.02.20 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*13.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව (2023),— 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 93(2) වගන්තිය යටතේ 2025.08.07 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*14.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2022),— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 27 දරන නීති ආධාර පනතේ 24(2) වගන්තිය යටතේ 2024.06.19 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*15.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2023),— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 27 දරන නීති ආධාර පනතේ 24(2) වගන්තිය යටතේ 2025.08.19 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*16.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2020),— 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 32 වගන්තිය යටතේ 2023.07.05 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.04.26 සහ 2025.11.18 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*17.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2021),— 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 32 වගන්තිය යටතේ 2024.01.09 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.04.26 සහ 2025.11.18 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*18.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2022),— 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 32 වගන්තිය යටතේ 2024.06.04 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*19.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2023),— 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 32 වගන්තිය යටතේ 2025.06.20 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*20.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ වාර්ෂික වාර්තාව (2022),— 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය පනතේ 23 වගන්තිය යටතේ 2024.07.24 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*21.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ වාර්ෂික වාර්තාව (2023),— 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය පනතේ 23 වගන්තිය යටතේ 2025.10.10 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*22.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*25.

විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— "2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

28.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

29.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

32.

යූඑන්වී පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

2339/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව හෝ ආයුර්වේද දෙපාර්තමේන්තුව හරහා 'ආයුර්වේද', 'සිද්ධ', 'යුනානි' සහ 'හෝමියෝපති' වෛද්‍ය අධ්‍යාපනයට අදාළ පාඨ ග්‍රන්ථ මුද්‍රණය කරනු ලබන්නේද;

(ii) එසේ නම්, අවසන් වරට පාඨ ග්‍රන්ථ මුද්‍රණය කරන ලද වර්ෂය සහ විෂයයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාරම්පරික වෛද්‍ය ක්‍රම පෝෂණය කිරීම සඳහා පසුගිය වර්ෂ 05 තුළ රජය විසින් මුද්‍රණය කර ඇති පාඨ ග්‍රන්ථ කවරේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

2340/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නඩු කටයුත්තකදී දරුවෙකුගේ පිතෘත්වය හෝ මාතෘත්වය සම්බන්ධයෙන් මතභේදයක් පැනනගින අවස්ථාවලදී, එම ප්‍රශ්නය විසඳීම සඳහා ජාන පරීක්ෂණ (DNA Tests) භාවිත කිරීමේ නීතිමය ප්‍රතිපාදන ඇති බවත්;

(ii) 1999 අංක 37 දරන නඩත්තු පනත යටතේ පවරනු ලබන නඩුවකදී පිතෘත්වය හෝ මාතෘත්වය සම්බන්ධයෙන් මතභේදයක් පැනනගින අවස්ථාවක, ජාන පරීක්ෂණයක් සඳහා අවශ්‍ය සාම්පල ලබාදෙන ලෙස නියෝග කිරීමට මහෙස්ත්‍රාත් අධිකරණයට බලය නොමැති බවත්;

(iii) දරුවෙකුගේ පිතෘත්වය හෝ මාතෘත්වය සම්බන්ධයෙන් දිසා අධිකරණය හමුවේ පවතින නඩු කටයුත්තකදී, ජාන පරීක්ෂණයක් සඳහා අවශ්‍ය සාම්පල ලබාදෙන ලෙස පාර්ශ්වයකට නියෝග කිරීමට ප්‍රමාණවත් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එවැනි නීතිමය ඌනතා නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හඳුන්වාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, සංශෝධනය කිරීමට හෝ හඳුන්වාදීමට අපේක්ෂිත නීති කවරේද;

(iii) එම නීති හඳුන්වාදීමට අපේක්ෂිත කාල රාමුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3. 2393/2026

ගරු තුරෙරාසා රවිකරන් මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ශ්‍රම වාසනා අරමුදල' මඟින් සපයන ලද සේවාවන් අතරින් කම්කරු අමාත්‍යාංශය විසින් අඛණ්ඩව සැපයීමට නියමිත සේවාවන් කවරේද;

(ii) අමාත්‍යාංශය විසින් තවදුරටත් සෘජුව පවත්වාගෙන නොයන සේවාවන් සහ එම සේවාවන් භාර ගැනීමට නියමිත ආයතන කවරේද;

(iii) එම සේවාවන් පැවරීම සඳහා සංක්‍රාන්ති ක්‍රියාකාරී සැලැස්මක් හා කාලරාමුවක් සකස් කර තිබේද;

(iv) සංක්‍රාන්ති කාලසීමාව තුළ ප්‍රතිලාභීන්ට සේවා හෝ ප්‍රතිලාභ අහිමි නොවීම සහතික කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?